අභ්‍යන්තර විභාග නිවේදනයයි !

මගේ අංකය: **PPSC/EX/3/1/7/2023**
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.
**2022.12.22**

පළාත් අධ්‍යක්ෂ,
සමාජ සේවා දෙපාර්තමේන්තුව (වයඹ).

**<u>වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ සමාජ සේවා දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ සමාජ සේවා නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2023</u>**

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ සමාජ සේවා දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ සමාජ සේවා නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2023 පෙබරවාරි මාසය තුළ කුරුණෑගලදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ සමාජ සේවා නිලධාරී II ශ්‍රේණියේ සිට වසර දහයක් (10) ක් ගත වීමට පෙර මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය (මෙම විභාගය I ශ්‍රේණියට උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කිරීමේ විභාගයකි) සමත් විය යුතු අතර, ඒ අනුව සුදුසුකම් ලද නිලධාරීන්ට මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අයදුම් කළ හැක.

**02.** මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍ර නිවැරදිව හා පැහැදිලිව පිළියෙල කරගත යුතු අතර එම අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් 2023.01.18 දින හෝ එදිනට පෙර "ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, බී දොරටුව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙලවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

**03.** අයදුම්පත්‍රය :- ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිතයට ගනිමින් පිළියෙල කරගත් අයදුම්පත්‍රය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය.

**04.** විභාග ගාස්තු :- පළමුවරට මෙම විභාගයට පෙනී සිටීමට කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ වුවත් ඉන් පසුවාරවලදී නිලධාරියෙකු විසින් එක් විෂයයකට වැඩි හෝ සම්පූර්ණ විභාගය සඳහා පෙනී සිටින්නේ නම් රු. 500/- ක්ද, එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු. 250/- ක්ද විභාග ගාස්තු වශයෙන් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරණ ආදායම් ශීර්ෂයට බැර වන පරිදි තම ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හෝ සේවා ස්ථානය පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ව.ප.ස.මු.-02 ආකෘතියෙන් ලබාගත් රිසිට්පත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

**05.** අනන්‍යතාව :- විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් කවරක් වුවද පිළිගත හැකිය.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

II. වලංගු විදේශ ගමන් බලපත්‍රය ( පාස්පෝට් බලපත්‍රය )

**06.** විභාග ප්‍රවේශපත්‍ර :- විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් සඳහා, ඔවුන් තම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති විද්‍යුත් තැපැල් ලිපිනයට **(E-mail address)** විභාග ප්‍රවේශපත්‍රය යොමු කරනු ලැබේ. අයදුම්කරුවන් විසින් තම විභාග ප්‍රවේශපත්‍රය භාගත කර ගත යුතු අතර, එලෙස විභාග ප්‍රවේශපත්‍රය භාගත කර ගත නොහැකි අයදුම්කරුවන් වෙතොත් විභාගය පැවැත්වෙන දිනට දින 03 කට පෙර ඒ බව වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයෙන් විමසිය යුතුය.

එලෙස අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර යොමු කළ වහාම ඒ බව වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යාලීය වෙබ් අඩවියේ (www.psc.nw.gov.lk) පළකරන අතර, ඒ බව අදාළ දෙපාර්තමේන්තු වෙතද ලිඛිතව දැනුම් දෙනු ලැබේ. දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අදාළ අයදුම්කරුවන්ව ඒ පිළිබඳව දැනුවත් කළ යුතුය.

සැළකිය යුතුයි -:

අයදුම්කරු විසින් තම අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන විද්‍යුත් තැපැල් ලිපිනයට විභාග ප්‍රවේශපත්‍රය යොමු කරන බැවින්, එය නිවැරදිව අයදුම්පත්‍රයේ සඳහන් කිරීම අනිවාර්යය වේ.

**07.** විභාගය සඳහා ප්‍රවේශපත්‍ර ලැබූ, පළමු වතාවට විභාගයට පෙනී සිටින නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතු අතර ගමන් ගාස්තු නොගෙවිය යුතුය.

**08.** අපේක්ෂකයින් අදාළ සේවයට ඇතුළත්වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයිය යුතුය. තරඟ විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධරයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයිය යුතුය.

**09.** විභාග පටිපාටිය :-

මෙම පරීක්ෂණය පහත සඳහන් විෂයයන් සම්බන්ධයෙන් සැකසෙන ලිඛිත ප්‍රශ්න පත්‍ර 04 කින් සමන්විත වේ. එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා උපරිම ලකුණු 100 කි. සමත් වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයකින් ලකුණු 40% ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

| අනු අංකය | විෂයය | කාලය | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01 | සමාජ විද්‍යාව | පැය 03 | 100 |
| 02 | මනෝ විද්‍යාව | පැය 03 | 100 |
| 03 | ආර්ථික විද්‍යාව | පැය 03 | 100 |
| 04 | සමාජ සුභසාධන ප්‍රතිපත්ති හා පරිපාලනය | පැය 03 | 100 |

විෂය නිර්දේශය :-

<u>1 ප්‍රශ්න පත්‍රය : සමාජ විද්‍යාව</u>

1. සමාජ විද්‍යාවේ ඉතිහාසය හා විකාශය
2. සමාජ විද්‍යා න්‍යායන්
   - ❖ පරිණාම වාදය
   - ❖ ගැටුම් න්‍යාය
   - ❖ කෘත්‍ය වාදය
   - ❖ අන්තර් ක්‍රියා වාදය

   ඉහත කරුණු පිළිබඳ මූලික අවබෝධය
3. ඥාතීත්වය, විවාහය හා පවුල
4. සමාජානුයෝජනය පිළිබඳ මූලික අවබෝධය
5. සමාජ ස්ථරායනය පිළිබඳ මූලික අවබෝධය
6. සංස්කෘතිය හා සමාජය
7. සමාජ විද්‍යා පර්යේෂණ ක්‍රම
   - ❖ ප්‍රශ්නාවලියන්
   - ❖ සම්මුඛ සාකච්ඡා
   - ❖ සහභාගි නිරීක්ෂණය
   - ❖ පාලිත කණ්ඩායම්
   - ❖ නිරීක්ෂණය
   - ❖ ක්ෂේත්‍ර අධ්‍යයනය
   - ❖ ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය
8. සමාජ ප්‍රශ්න පිළිබඳ හැඳින්වීම
   - ❖ වර්ගවාදය
   - ❖ දිළිඳුභාවය
   - ❖ විරැකියාව
   - ❖ සියදිවි හානි කර ගැනීම
   - ❖ ජනගහණය
   - ❖ බීමත්කම
   - ❖ යාචකභාවය
   - ❖ ගණිකාභාවය
9. ලංකා සමාජය
   - ❖ ලංකා සමාජයේ ආගම හා සංස්කෘතිය
   - ❖ කුල ක්‍රමය
10. ලංකා සමාජයේ සමාජ ගැටළු
    - ❖ සංවර්ධන ව්‍යාපෘතීන් හරහා ඇතිවන සමාජ ගැටළු
11. සංචාරක ව්‍යාපාරය
12. ලංකාවේ පවතින ගෝත්‍රික සමාජ

## 2 වන ප්‍රශ්න පත්‍රය : මනෝ විද්‍යාව

1. මනෝ විද්‍යාව හැඳින්වීම
    - මනස හා කය අතර සබඳතාවය
    - මූලික සංකල්ප හඳුනා ගැනීම
        - I. හැසිරීම
        - II. බිය
        - III. ජීව විද්‍යාත්මක ප්‍රපංචය
2. මනෝ විද්‍යාව විද්‍යාවක් වන්නේ කෙසේද?
    - ඉතිහාසය
    - ආර්ථික පුනරුදය
3. සංවර්ධන මනෝ විද්‍යාව
    - ජීන් පියාජේගේ සංවර්ධන අවධීන්
    - සිග්මන් ෆ්‍රොයිඩ්ට අනුව සංවර්ධන අවධීන්
    - ළමා සංවර්ධනයේදී ආරය හා පරිසරයේ බලපෑම
4. පෞරුෂත්වය
    - මනෝ විශ්ලේෂණවාදී න්‍යායට අනුව
        - I. ඉලෙක්ට්‍රා ඊඩිපස් සංකීර්ණය
        - II. සංරක්ෂණ ප්‍රයෝගය
    - නව මනෝ විශ්ලේෂණවාදයට අනුව ඇල්ෆ්‍රඩ් ඇඩ්ලර්ගේ
        - I. සමාජ ආශ්‍රයන් පිළිබඳ සංවර්ධන න්‍යාය
        - II. ඊගෝ ශක්තිය (Power of Ego)
5. සංජානනය
    - සංජානනය පිළිබඳ හැඳින්වීම
    - සංජානනයේ වැදගත්කම
    - සංජානන ක්‍රියාවලියක් සිදුවන ආකාරය
    - සංජානන වර්ග
6. සමාජ මනෝ විද්‍යාව
    - හැඳින්වීම
7. උපදේශන මනෝ විද්‍යාව
    - හැඳින්වීම
    - උපදේශනය යනු කුමක්ද?
    - උපදේශනයේ මූලික න්‍යායන්
        - I. මනෝ විශ්ලේෂණවාදී න්‍යාය
        - II. චර්යාවාදී න්‍යාය
        - III. ප්‍රජනනවාදී න්‍යාය
        - IV. මානවවාදී න්‍යාය
        - V. සාදෘෂ්‍යීකවාදී න්‍යාය
8. සමකාලීන මනෝ විද්‍යාත්මක න්‍යායන්
    - මනෝ විශ්ලේෂණ වාදය
    - චර්යා වාදය
    - මානව වාදය
    - ප්‍රජනන වාදය
    - සාදෘෂ්‍යීක වාදය

3 වන ප්‍රශ්න පත්‍රය : ආර්ථික විද්‍යාව

1. මූලික සංකල්ප
   - හිඟකම
   - ආවස්ථික පිරිවැය
   - නොමිළ භාණ්ඩ
   - ආර්ථික භාණ්ඩ
   - මූලික ආර්ථික ප්‍රශ්න
   - කුමක්, කොපමණ නිපදවිය යුතුද?
   - කෙසේ නිපදවිය යුතුද?
   - කා සඳහා නිපදවිය යුතුද ?
2. විවිධ අර්ථක්‍රම
   - ධනවාදී අර්ථ ක්‍රමය, සමාජවාදී අර්ථ ක්‍රමය, මිශ්‍ර අර්ථ ක්‍රමය
   - වෙළඳපොල ක්‍රමය, සැලසුම්ගත ක්‍රමය
   - සංවර්ධිත, ඌන සංවර්ධිත
   - කාර්මික භාණ්ඩ නිපදවන, මූලික භාණ්ඩ නිපදවන
   - මිශ්‍ර ධනවාදී, මිශ්‍ර සමාජවාදී, ඌන සංවර්ධිත
3. නිෂ්පාදනය හා පරිභෝජනය
   - නිෂ්පාදන සාධක
   - සේවා වියුක්තිය
   - ඌන සම්පත් උපයෝජනය
   - ආර්ථික වර්ධනය
   - ශ්‍රම විභජනය
   - ශ්‍රම විභජනයේ වාසි/ අවාසි
4. පාරිභෝගික හැසිරීම පිළිබඳ ආර්ථික න්‍යායන්
   - නිෂ්පාදන හැකියා මායිම
   - ආන්තික උපයෝජන න්‍යායන්
   - උපේක්ෂා වක්‍ර
   - පාරිභෝගික සමතුලිතතාවය
   - නිෂ්පාදන පිරිවැය හා පිරිවැය වක්‍ර
   - ආදායම් හා ආදේශන ප්‍රතිවිපාක
   - ඉල්ලුම, සැපයුම හා මිළ තීරණය වීම
   - ඉල්ලුම - බලපාන සාධක, ඉල්ලුම් න්‍යාය, ඉල්ලුම් නම්‍යතාවය
   - සැපයුම - බලපාන සාධක, සැපයුම් න්‍යාය, සැපයුම් නම්‍යතාවය
   - මිළ තීරණය වීම
   - වෙළඳපල සමතුලිතය
5. ආර්ථික න්‍යාය
   - පූර්ණ තරඟය
   - ඒකාධිකාරය
   - ඒකාධිකාරී තරඟය
   - කතිපයාධිකාරිය

6. ජාතික ආදායම් සංකල්පය
    - දළ දේශීය නිෂ්පාදිතය/ දළ ජාතික නිෂ්පාදිතය
    - ජාතික ආදායමේ චක්‍රීය ව්‍යුහය
    - ජාතික ආදායම ගණනය කිරීමේ ක්‍රමවේදය
    - ද්විගණන දෝෂය
    - ආර්ථික වර්ධනය හා ආර්ථික සංවර්ධනය
    - උද්ධමනය හා අවධමනය
    - ලංකාවේ උද්ධමනය
    - ජීවන වියදම් දර්ශක
7. මුදල් හා බැංකු ක්‍රමය
    - මුදලේ ලක්ෂණ, කාර්ය භාරය, ව්‍යවහාර මුදල්, බැංකු මුදල්
    - වාණිජ බැංකුවල මුදල් මැවීම
    - ලංකාවේ මහ බැංකුවේ කාර්යය භාරය
    - මූල්‍ය පාලන විධි
    - රාජ්‍ය මූල්‍ය
    - හිඟ මුදල් සම්පාදනය
    - අයවැය
    - අයවැය හිඟය
    - පළාත් සභා ක්‍රමය - පළාත් සභා අරමුදල් සැපයෙන මාර්ග
8. විදේශ වෙළඳාම හා ගෙවුම් තුලනය
    - ලංකා ආර්ථිකයේ මූලික ලක්ෂණ
    - විදේශ විනිමය අනුපාතය
    - ගෙවුම් තුලන අර්බුදයට හේතු
    - ජනගහණ ප්‍රශ්නය හා සේවා වියුක්තිය
    - නිදහස් වෙළඳ කලාප
    - ලංකා ආයෝජන මණ්ඩලය
    - රුපියලේ වටිනාකම පාවීම
9. නිදහසින් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ වෙනස්වීම
    - විවෘත ආර්ථික ප්‍රතිපත්තිය
    - සමූපකාර ව්‍යාපාරය
    - ජනසතුකරණය
    - පෞද්ගලීකරණය
    - කාර්මික හා කෘෂිකාර්මික ප්‍රතිපත්ති
    - ලංකාවේ මූල්‍ය ආයතන
10. ලංකාවේ සුභසාධන ප්‍රතිපත්ති
    - ජනවාර්ගික අර්බුදය හා ආර්ථික වර්ධනය
    - ලංකාවේ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති

<u>4 වන ප්‍රශ්න පත්‍රය : සමාජ සුභසාධන ප්‍රතිපත්ති හා පරිපාලනය</u>

1. ලංකාවේ ක්‍රියාත්මක වන සමාජ සුභසාධන වැඩසටහන් හා ප්‍රතිපත්ති
2. ආබාධිතභාවය ආශ්‍රිතව ලංකාවේ අත්දැකීම් හා ප්‍රතිපත්ති
3. වියපත්භාවය ආශ්‍රිතව ලංකාවේ අත්දැකීම් හා ප්‍රතිපත්ති
4. ලංකාවේ සමාජ සුභසාධන ආයතන
5. මත්ද්‍රව්‍ය භාවිතය හා ලංකා සමාජයේ ආකල්ප
6. ලංකාවේ ක්‍රියාත්මක වන සමාජ සුභසාධන ක්‍රියාවලීන්

❖ සමෘද්ධි
❖ මහජනාධාර
❖ ආබාධිත උපකරණ සැපයීම
❖ විවිධ සහනාධාර

7. දුගී බවේ විෂම චක්‍රය හා සමාජ සුභසාධන ප්‍රතිපත්ති
8. මූලික පරිපාලන හා කළමනාකරණ න්‍යාය ධර්ම ලංකාව ආශ්‍රයෙන්
9. මුල් ළමාවිය සංවර්ධනය
10. ආපදා කළමනාකරණය හා ලංකාවේ ආපදා පිළිබඳ නව ප්‍රවණතා

සටහන :-

01. පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධි පරීක්ෂණයේදී ප්‍රධාන විෂයක් ලෙස ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව හා මනෝ විද්‍යාව යන විෂයන්ගෙන් සමත්ව ඇති අය එම අදාළ විෂයන් සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

10. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝග පරිදි තීරණය කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,



ටී.බී. වික්‍රමසිංහ,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

ආදර්ශ අයදුම්පත්‍රය

**වයඹ පළාත් සහා රාජ්‍ය සේවයේ සමාජ සේවා දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ සමාජ සේවා නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2023**

01.1.1 මුලකුරු සමඟ නම (සිංහලෙන්) :- ..........................................................................
.................................................................................................මයා/මිය/මෙනවිය

1.2 මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) :- ..........................................................................
.................................................................................................................

1.3 මුලකුරු වලින් හැඳින්වෙන නම (සිංහලෙන්) :- ..........................................................
.................................................................................................................

1.4 විද්‍යුත් තැපැල් ලිපිනය (E-mail) :- ..........................................................................
.................................................................................................................

(මෙම ලිපිනයට විභාග ප්‍රවේශපත්‍රය යොමු කරනු ලැබේ.)

1.5 ජාතික හැඳුනුම්පත් අංකය :- | | | | | | | | | | | | |

1.6 උපන් දිනය :- අවුරුද්ද | | | | | මාසය | | | දිනය | | |

02. සේවා ස්ථානය හා ලිපිනය :-

2.1 කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ නම :-
.................................................................................................................

2.2 රාජකාරි ලිපිනය :- .......................................................................................
.................................................................................................................

2.3 දුරකතන අංකය :- රාජකාරී : ..........................................................
පෞද්ගලික : ..........................................................

03. දැනට දරණ තනතුර :-

3.1 තනතුර :- ..........................................................................................
3.2 ශ්‍රේණිය :- ..........................................................................................
3.3 ඉහත ශ්‍රේණියට පත්වූ දිනය:- ..........................................................

04. ඔබ විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යය :- [ ]
(සිංහල - S , දෙමළ - T , ඉංග්‍රීසි - E )
(අදාල අක්ෂරය කොටුව තුල ලියන්න)

05. ඔබ විභාගයට ඉල්ලුම්කරන විෂයයන් :- (ප්‍රශ්න පත්‍රයේ නම සඳහන් කරන්න.)

I. ..........................................................................

II. ..........................................................................

III. ..........................................................................

IV. ..........................................................................

**06.** ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවටද ? ..........................................

**6.1** එසේ නොවන්නේ නම් විභාග ගාස්තු ගෙවා ලබාගත් (අලවා ඇති) කුවිතාන්සියේ,

කුවිතාන්සි අංකය :- ...................................... මුදල :- ................................
දිනය :- ....................................................
නිකුත් කල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :- ....................................................

| කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න. |
| --- |

**07.** අයදුම්කරුගේ සහතිකය :-

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහත 4 ඡේදයේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. මෙම විභාගය සඳහා පනවා ඇති නීති රීති පිළිපැදීමටද එකඟ වන අතර මා වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියෙකු / නිලධාරිනියක බවද සහතික කරමි.

.........................................................
අයදුම්කරුගේ අත්සන

දිනය:- ....................................

**08.** දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :-

I. ඉහත විස්තර සඳහන් ..............................................................................නැමැති මෙම නිලධාරියා/ නිලධාරිනිය මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටින වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියෙකු/ නිලධාරිනියක බවද,
II. ඔහු/ඇය සමාජ සේවා නිලධාරී ............. ශ්‍රේණියේ නිලධාරියෙකු/ නිලධාරිනියක බවද, ඔහු/ඇය පෙනී සිටිය යුතු පරීක්ෂණය ............................ වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය බවද, මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් සපුරා ඇති බවද,
III. විභාගයට පෙනී සිටින්නේ පළමු වතාවට බවද/ පළමු වතාවට නොවන බවද, නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා ඇති/ නැති බවද,
IV. අයදුම්කර ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම ඇති බවද,
V. ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවද, සහතික කරමි.
(අදාල නොවන වචන කපා හරින්න)

...............................................
ආයතන / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව

පදවි නාමය :...........................................................
ලිපිනය :...........................................................
දිනය :...........................................................